අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය
ආදර්ශ ප්‍රශ්න පත්‍රය - 10

සාමාන්‍ය තොරතුරු තාක්ෂණය

කාලය පැය 03 යි
සියළු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

---

1. 300 යන දශමය සංඛ්‍යාවට තුල්‍ය වන ෂඩ්දශමය (hexadecimal) සංඛ්‍යාව වනුයේ,
   (1) 120 (2) 12C (3) 300 (4) 14A

2. 10 යන දශමය සංඛ්‍යාවට තුල්‍ය වන අෂ්ටක (octal) සංඛ්‍යාව වනුයේ,
   (1) 12 (2) 14 (3) 16 (4) 8

3. 11110 යන ද්විමය සංඛ්‍යාවට තුල්‍ය වන ෂඩ්දශමය (hexadecimal) සංඛ්‍යාව වනුයේ,
   (1) 16 (2) 20 (3) 1E (4) 22

4. 010101 යන ද්විමය සංඛ්‍යාව 111011 ද්විමය සංඛ්‍යාවෙන් අඩු කළ විට ලැබෙන පිළිතුර වනුයේ,
   (1) 101010 (2) 100110 (3) 100010 (4) 100101

5. මෙගාබයිටයක් (megabyte) සර්වසම වනුයේ,
   (1) බයිට 1024x1024 කට (1024 x 1024 bytes) (2) කිලෝබයිට 1000 කට (1000 kilobytes)
   (3) බයිට 1000 කට (1000 bytes) (4) බයිට 1000x1000 කට (1000x1000 bytes)

6. 1 + A තාර්කික ප්‍රකාශනය සර්වසම වනුයේ,
   (1) 1 (2) A (3) 0 (4) 1A

7. පහත දී ඇති සත්‍යතා වගුවෙන් (truth table) නිරූපණය වන තාර්කික මෙහෙයුම වනුයේ,

Input 1	Input 2	Input 3	Input 4	Output
0	0	0	0	0
0	0	0	1	1
0	0	1	0	1
0	0	1	1	1
0	1	0	0	1
0	1	0	1	1
0	1	1	0	1
0	1	1	1	1
1	0	0	0	1
1	0	0	1	1
1	0	1	0	1
1	0	1	1	1
1	1	0	0	1
1	1	0	1	1
1	1	1	0	1
1	1	1	1	1

   (1) NOR (2) NAND (3) AND (4) OR

8. නිපුණ පද්ධතියකින් (Expert System) ලැබෙන වාසියක් නොවන්නේ,
   (1) මිනිසෙකුට මතක තබාගත හැකි තොරතුරු ප්‍රමාණයට වඩා විශාල ප්‍රමාණයක් පරිගණකයක ගබඩා කරගත හැකි වීම.
   (2) යාවත් කාල කරන ලද (updated) දත්ත තබාගත හැකි වීම.
   (3) දවසේ පැය 24 පුරා නිපුණ පද්ධතිය භාවිත කළ හැකි අතර, එය කිසි විටෙක වෙහෙසට පත් නොවන්නක් වීම.
   (4) මුදල් පිළිබඳ විස්තර, බොත්තම් එබූ සැණින් ලබාගත හැකි වීම.

9. 2341 යන දශමය සංඛ්‍යාව BCD පද්ධතිය මඟින් නිරූපණය කළ විට ලැබෙන්නේ,
(1) 0010 0011 0100 0001
(2) 1001 0010 0101 0001
(3) 0100 0101 0100 0001
(4) 0010 0101 0100 0001

10. පහත දී ඇති තාර්කික පරිපථයේ A,B හා C වල අගයයන් පිළිවෙලින් වන්නේ,



(1) 0,0 හා 0
(2) 0,1 හා 1
(3) 1, 1 හා 1
(4) 1,0 හා 1

11. පද්ධති ජීවන සැලසුම් චක්‍රයේ (SDLC) වැඩසටහන් නිර්මාණය කිරීම හා අදාළ අවධිය වනුයේ,
(1) පද්ධති විශ්ලේෂණය (Analysis)
(2) පද්ධති සැලසුම් නිර්මාණය කිරීම (Design)
(3) පද්ධති වැඩිදියුණු කිරීම (Development)
(4) පද්ධති නඩත්තුව (Maintenance)

12. ආංශිකව පද්ධති ක්‍රියාවේ යෙදවීම (Phased Implementation) අවධිය හා අදාළ වන්නේ,
(1) පැරණි පද්ධතිය භාවිතයෙන් සම්පූර්ණයෙන් ඉවත් කර, යුහුසුළුව නව පද්ධතිය භාවිතා කිරී ඇරඹීමයි.
(2) නව පද්ධතිය මනාව ක්‍රියා කරන බව තහවුරු කර ගන්නා තෙක් නව පද්ධතිය හා පැරණි පද්ධතිය යන දෙකම භාවිතා කිරීමයි.
(3) නව පද්ධතිය භාවිතා කිරීමට කුඩා කණ්ඩායමකට පමණක් ඉඩ ලබා දීමයි.
(4) නව පද්ධතිය ආංශිකව (phased) ක්‍රියාවේ යෙදවීමයි.

13. පහත ඒවායින් පද්ධති ක්‍රියාවේ යෙදවීම් (Implementation) ආකාරයක් නොවන්නේ,
(1) සමාන්තරගත ක්‍රියාවේ යෙදවීම (Parallel Implementation)
(2) නියමු ක්‍රියාවේ යෙදවීම (Pilot Implementation)
(3) පද්ධති ක්‍රියාවේ යෙදවීම (System Implementation)
(4) කඩිනම් ක්‍රියාවේ යෙදවීම (Plunge Implementation)

14. රූපමය අන්තර් මුහුණතක් (GUI) ලබා නොදෙන මෙහෙයුම් පද්ධතිය (Operating System) වන්නේ,
(1) Unix
(2) DOS
(3) Windows 98
(4) Windows Me

15. වින්ඩෝස් (Windows) මෙහෙයුම් පද්ධතියේ විවෘත කරන ලද වැඩසටහනක් හැකිළවීමට (Minim ක්ලික් කළ යුතු බොත්තම වන්නේ,



(1) 1
(2) 2
(3) 3
(4) ඉහත පෙන්වා නොමැත.

16. මයික්‍රොසොෆ්ට් වර්ඩ් (Microsoft Word) හි, උද්දීපනය කරන ලද පෙළක් (Highlighted text) සඳහ Ctrl+U යතුරු පහර ලබා දුන් විට එය පහත කවරක් බවට පත්වේ ද?
(1) තද අකුරු (bold) පෙළක්
(2) ඉතාලි අකුරු (italic) පෙළක්
(3) යටින් ඉරි ඇඳි අකුරු (underline) පෙළක්
(4) බුලටමය ලැයිස්තු (bulleted list)

17. මයික්‍රොසොෆ්ට් වර්ඩ් (Microsoft Word) සමඟ Copy විධානය යොදා ගත් විට, පිටපත් කළ යුතු අයිතම (Items) තැන්පත් වන්නේ පහත කුමක් තුළ ද?
(1) සසම්භාවී ප්‍රවේශ මතකය (RAM) තුළ
(2) පසුරු පුවරුව (Clipboard) තුළ
(3) සුසංහිත තැටියක (CD)
(4) පිළිසකර බඳුන (Recycle Bin) තුළ

18. පෙළක් (Text) දීර්ඝ වන විට, අමතර වචන ස්වයංක්‍රීයව ඊළඟ පේළියට (Next line) ගමන් කිරීම කවර නමකින් හැඳින්වේ ද?
(1) Wordiness (2) Page format (3) Page layout (4) Word wrap

19. වලංගු ඒකීය සම්පත් පිහිටුවනයක් (Uniform Resource Locator-URL) සඳහා උදාහරණයක් වන්නේ,
(1) http:/ww.msn.com (2) www@com
(3) gihan@hotmail.com (4) ftp://ftp.info.gihanbookshop.com

20. HTTP යනුවෙන් ප්‍රකාශ වන්නේ,
(1) Hyper Text Transfer Protocol (2) Hyper Tele Text Protocol
(3) Hyper Text Tele Protocol (4) Hyper Text Transfer Polling

21. දත්ත සමුදායක (Database) රෙකෝඩ (records) අකාරාදී අනුපිළිවෙලට පිළියෙල කිරීම කවර නමකින් හැඳින්වේ ද?
(1) නැවත ස්ථානගත කිරීම (Replace) (2) සෙවීම (Searching)
(3) සුබෙදීම (Sorting) (4) විකරණය කිරීම (Modifying)

22. දත්ත සමුදාය වගුවක (Database table) රෙකෝඩයක් (record) අනන්‍යව හඳුනා ගැනීමට උපකාරී වන යතුර වන්නේ,
(1) අපේක්ෂක යතුර (Candidate key) (2) අන්‍ය යතුර Foreign key)
(3) ප්‍රාථමික යතුර (Primary key) (4) ද්විතීයික යතුර (Secondary key)

23. දත්ත සමුදායක් (Database) ආරම්භ කළ පසු, නව තොරතුරු වර්ගයක් එකතු කිරීමට අවශ්‍ය වූ විට ඔබ කළ යුත්තේ,
(1) පෙරණයක් (Filter) එකතු කිරීමයි. (2) ක්ෂේත්‍රයක් (Field) එකතු කිරීමයි.
(3) රෙකෝඩයක් (Record) එකතු කිරීමයි. (4) ක්ෂේත්‍රයක් (Field) මකා දැමීමයි.

24. පැස්කල් (Pascal) හි නිවැරදි ලෙස සටහනක් (Comment) යොදා ගෙන ඇති ආකාරයට උදාහරණයක් වන්නේ,
(1) // begin declarations// (2) (*number is stored here *)
(3) # Name is selected # (4) < Total members >

25. පැතුරුම්පතක (Spreadsheet) ඇති දත්ත විශ්ලේෂණය (Analyze) කිරීමට යොදා නොගන්නා මෙවලමක් (Tool) වන්නේ,
(1) එසේ නම් කුමක්ද? (What If) ආකාරයේ විශ්ලේෂණය
(2) තැපැල් මුසුව (Mail merge)
(3) ප්‍රස්ථාර (Charts)
(4) සුබෙදීම (Sorting)

පහත දී ඇති පැතුරුම්පත (spreadsheet) අධ්‍යයනය කර 26, 27 හා 28 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



	A	B	C	D	E	F	G	H
1								
2			Thurstan College Student Marks -Grade 4					
3								
4		Student Name	Maths	Science	Sinhala	English	Total Marks	
5		Sandun	87	76	84	64	311	
6		Dharshana	40	75	43	43	201	
7		Waruna	60	43	77	44	224	
8		Dammika	70	33	44	66	213	
9		Lalani	54	76	88	79	297	
10		Erangi	75	77	66	55	273	
11								
12		Average	64.33%	63.33%	67.00%	58.50%		
13								
14								
15								

26. G10 කෝෂයේ (Cell) අඩංගු විය යුතු ශ්‍රිතය වන්නේ,
(1) = C10:F10 (2) = SUM (C10:F10) (3) = SUM (C10:G10) (4) SUM (C10:F10)

27. F12 කෝෂයේ අඩංගු වන්නේ,
(1) ලේබලයකි (label)
(2) අගයකි (value)
(3) සූත්‍රයකි (formula)
(4) සිරස් තලයකි (heading)

28. C12 කෝෂයේ අඩංගු විය යුතු සූත්‍රය වන්නේ,
(කෝෂය ප්‍රතිශත (Percentage) ආකාරයට හැඩ ගන්වා ඇති බව සලකන්න)
(1) = (SUM (C5:C10)/6)/100
(2) = (SUM (C4:C10)/6)/100
(3) = (SUM (C5:D10))/6
(4) = SUM (C5:C10/6)/100

29. පැස්කල් (Pascal) හි යොදා ගන්නා වෙන් කළ වචනයක් (reserved word) වන්නේ,
(1) Average (2) Sum (3) Total (4) If

30. පැස්කල් (Pascal) හි භාවිතා වන වලංගු කාරකයක් (Operator) නොවන්නේ,
(1) = (2) < > (3) < (4) > +

31. Sunday, Monday, Tuesday, Wednesday, Thursday, Friday සහ Saturday ලෙස අගයයන් ඇති days නම් වූ ගණනා දත්ත වර්ගයක් (Enumerated data type) නිවැරදිව හඳුන්වා දිය යුත්තේ කෙසේ ද?
(1) type days ; (Sunday,Monday,Tuesday,Wednesday,Thursday,Friday,Saturday);
(2) type days (Sunday,Monday,Tuesday,Wednesday,Thursday,Friday,Saturday);
(3) var days = (Sunday,Monday,Tuesday,Wednesday,Thursday,Friday,Saturday);
(4) type days = (Sunday,Monday,Tuesday,Wednesday,Thursday,Friday,Saturday);

32. පැස්කල් (Pascal) හි භාවිතා වන වලංගු සංසන්දනාත්මක කාරකයක් (Operator) නොවන්නේ,
(1) > (2) < (3) = (4) = =

33. මයික්‍රොසොෆ්ට් පවර්පොයින්ට් (Microsoft Powerpoint) හි යාබද ස්ලයිඩ (slide) තෝරා ගැනීම සඳහා පළමු ස්ලයිඩය මත ක්ලික් කර ..... යතුර තද කරගෙන අවසාන ස්ලයිඩය මත ක්ලික් කළ යුතුය.
(1) Shift (2) Ctrl (3) Ctrl+Shift (4) Enter

34. මයික්‍රොසොෆ්ට් පවර්පොයින්ට් (Microsoft Powerpoint) හි මෙනු තීරුවෙන් File → Print විකල්පය ඔස්සේ ලබා ගත හැකි, ඔබට අභිමත මුද්‍රණ තේරීම් (Custom Printing Selections) ලබා ගැනීමට ඉඩ ලබා දෙන සංවාද කවුළුව (Dialog box) වන්නේ,
(1) Preview (2) Print (3) Page Setup (4) Format

35. පහත උපක්‍රම (Devices) අතුරින් ප්‍රතිදාන (Output) උපක්‍රමයක් ලෙස පමණක් ක්‍රියා කරන්නේ,
(1) වෙබ් කැමරාව (Webcam)
(2) මූසිකය (Mouse)
(3) සුපරීක්ෂනය (Scanner)
(4) කන් යොමුව (Earphone)

36. පරිගණක ජාලයක් (Network) හා අදාළ නොවන පදය වන්නේ,
(1) නාභිය (Hub)
(2) ස්ථලකය (Topology)
(3) සේවාදායකයා (Server)
(4) USB දොරටුව (USB Port)

37. සත්‍යාපන අරමුණු සඳහා (Authentication purposes) මිනිස් ශරීර ලක්ෂණ මැනීම හා විශ්ලේෂණය කිරීමේ තාක්ෂණය කවර නමකින් හැඳින්වේ ද?
(1) පාද සලකුණු (Foot printing)
(2) ජීව මාත්‍රික (Biometrics)
(3) මනුෂ්‍යත්වාරෝපය (Anthropomorphism)
(4) ප්‍රකාශ ක්ෂර හඳුනා ගැනීම (Optical Character Recognition)

38. www යනුවෙන් ප්‍රකාශ වන්නේ,
(1) World Wide Web (2) Wild Wild Web (3) Who What Where (4) World Web Watch

39. රාජකාරි ක්ෂමතා අධ්‍යයනය (Ergonomics) යනු,
(1) ග්‍රීක බසින් : Ergo - රාජකාරිය ; Nomos - නීති
(2) පුද්ගලයෙකුට රැකියාවේ ඇති යෝග්‍යතාවයයි.
(3) රාජකාරි සහ ඒවා මඟින් පුද්ගලයාට කෙසේ බලපෑම් ඇතිවේද යන්න අධ්‍යයනය කිරීමයි.
(4) ඉහත සියල්ල

40. පරිගණක මොනිටරය (Monitor) තිබිය යුතු හොඳම ආකාරය වන්නේ,
(1) පෙළ (Text) පැහැදිලිව බලා ගැනීම සඳහා මඳක් ඉදිරියට නැමීමට සිදුවන පරිදිය.
(2) විදුලි පහන්වල ආලෝකය මොනිටර තිරය මතින් පරාවර්තනය වන ආකාරයටය.
(3) පෙළ පැහැදිලිව කියවීම සඳහා, ඉදිරියට නැමීම, බෙල්ල කරකැවීම හෝ ඕනෑවට වඩා ඉහළ බලා සිටීමට අවශ්‍ය නොවන පරිදිය.
(4) ඉහත සියළු ආකාරවලටය.